JMC vLearning
"your virtual learning partner"

# තනි පුද්ගල බදුකරණය - උදාහරණය

තුෂාර ඉන්දික ජයවීර

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

**මංගල දිසානායක මහතා වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස 2010 වර්ෂයේ සිට ඉදිකිරීම් සමාගමක සේවය කරයි. 2010/2019 අදාළව පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.**

**1) සේවා නියුක්ති ආදායම**

- මූලික වැටුප - මසික 280,000/-
- අනුමත අර්ථසාධක අරමුදල් සඳහා දායකය.
- තමාගේ කොටස 8%
- සමාගටම් කොටස 12%

- දිසානායක මහතාගේ මෝටර් රථයේ කල්බදු වාරිකය සමාගම විසින් ගෙවන අතර තක්සේරු වර්ෂය තුල මාස 09ක කල්බදු වාරික ගෙවා ඇත. මසක කල්බදු වාරිකය රුපියල් 45,000/- කි.

- දිසානායක මහතාගේ නිවසේ කුලිය සමාගම විසින් දරණ අතර මසකට රුපියල් 40,000/- බැගින් තක්සේරු වර්ෂය තුල ගෙවා ඇත.

- උපයන විට ගෙවීමේ බද්ද වශයෙන් වසර තුල රුපියල් 337,000/- අඩු කර ඇත.

**2) වෘත්තීය ආදායම**

- දිසානායක මහතා ශ්‍රී ලංකාවේ සමාගම් සඳහා වෘත්තීය ඉංජිනේරු සේවා සපයන අතර 5% රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු රුපියල් 475,000/- ලැබී ඇත. මෙම ආදායම ඉපයීමේදී රුපියල් 123,000/- ක වියදමක් දරා ඇත.

- දිසානායක මහතා මාලදිවයින තුල පිහිටි හොටල් සමාගමක් සඳහා ශ්‍රී ලංකාවේ සිට සේවා සපයා ඇති අතර විදේශ මුදලින් USD 1460 ශුද්ධආදායමක් උපයා ඇත. (USD1=169)

### ව්‍යාපාර ආදායම

දිසානායක මහතා අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යන අතර 2019 මාර්තු 31 වන දිනට අදාළ තොරතුරු පහත දැක්වේ.

| මුලු ආදායම | රුපියල් |
|---|---|
| **අඩු කලා** | 6,230,000 |
| **දේශණ ගාස්තු** | 1,442,000 |
| **වැටුප් සහ වෙනත්** | 600,000 |
| **ලිපිද්‍රව්‍ය** | 240,000 |
| **ක්ෂය** | 50,000 |
| **ජලය , විදුලිය සහ වෙනත්** | 110,000 |
| **පොලිය** | 272,000 |
| **පරිත්‍යාග** | 50,000 |
| **වෙනත් වියදම්** | 60,000 |
| | 3,406,000 |

- භාවිතයේ තිබෙන පරිගණකය මිලදී ගන්නා ලද්දේ 2016/2017 තක්සේරු වසරේ වන අතර පිරිවැය රුපියල් 100,000/- මුද්‍රණ යන්ත්‍රය 2018/2019 මිලදී ගත් අතර එය රුපියල් 75,000/- ක පිරිවැයකින් යුක්තය. වෙනත් සුදුසුකම් ලබන වත්කම් කිසිවක් නැත.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- පොලිය ගෙවා ඇත්තේ දියණිය සඳහා ඉදි කරන ලද නිවස සඳහා ගත් ණයත් සම්බන්ධයෙනි.
- ජාතික රෝහල සඳහා රුපියල් 50,00/- පරිත්‍යාගයක් දරා ඇත.

**ආයෝජන ආදායම**

- ලැබූ ශුද්ධ පොලිය 95,000/-
- ලැබුණු ශුද්ධ ලාභාංශ රුපියල් 24,000/-
- මිල කල සමාගමක කොටස් විකිණීමේ ලාභය 11,000/-
- ලැබුණු ශුද්ධ කුලිය රුපියල් 864,000/- වන අතර එම ගොඩනැගිල්ල සඳහා ලබා ගත් ණය වෙනනුවෙන් දැරූ පොලී වියදම 210,000/- අලුත්වැඩියා වශයෙන් 14,000/- දරා ඇත. වරිපනම් තක්සේරුව රුපියල් 100,000/- ගෙව ඇති වරිපනම් රුපියල් 20%කි.
- 2010 වසරේ මිලදී ගත් ගොඩනැගිල්ලක් 2018/2019 වසර තුල විකුණා ඇත.

  - පිරිවැය රුපියල් 1,800,000/-
  - විකුණුම් මිල රුපියල් 3,600,000/-
  - 2017/09/30 දින වටිනාකම රුපියල් 3,000,000/-

  ප්‍රාග්ධන ලාභ මත බද්ද ගෙවා වාර්තාව ගොනු ගත කර ඇත.

දිසානායක මහතා පහත වියදම් සිදු කර ඇත.

1. අනුමත ව්‍යාවසායකරුවන් සඳහා කරන ලද පරිත්‍යාග රුපියල් 40,000/-
2. ස්ව තක්සේරු පදනම මත ගෙවූ රුපියල් 500,000/-කි.

   දිසානායක මහතා 2018/2019 තක්සේරු වසර තුල ගෙවිය යුතු අදායම් බද්ද ගණනය කරන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd